28 . 07 - 2016

ක්‍රිස්තියානි ධර්මය 43. කථිකාචාර්ය, ශාස්ත්‍රපති. එරික් සිසිලන් ඩයස්. ඩී.ටී එච්. (ශ්‍රී ලංකාව), බී.ඒ. විශේෂ (ගෞරව) (රෝමය), එම්.ඒ. (ශ්‍රී ලංකාව). 77 7 85 35 35. ද මැසිනොද් විද්‍යාලය, කඳාන.

ද මැසිනොද් විද්‍යාලය, කඳාන - ශ්‍රී ලංකාව

ක්‍රිස්තියානි ධර්මය

12 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය - 2016 අගෝස්තු

43

2 පත්‍රය (බහුවරණ)

අ.පො.ස. උ/පෙළ විභාගය 2015 - 2017

කාලය පැය 03 යි

Learning Resource Center
De Mazenod College
Kandana

නම: .... පන්තිය: .... විභාග/පන්ති අංකය: ....

උපදෙස්:

- ➢ මෙහි I හා II වශයෙන් කොටස් ද්විත්වයකි. I කොටසින් කෙටි ප්‍රශ්න දෙකක් ද, II කොටසින් රචනාමය ප්‍රශ්න තුනක් ද වශයෙන් තෝරා ගනිමින්, සම්පූර්ණ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- ➢ පිළිතුරු සාර්ථක කොට ගැන්ම සඳහා, බයිබල් පාඨ උපුටා දැක්වීම් සහ නිදර්ශන යොදා ගන්න.
- ➢ අත් අකුරු පැහැදිලි වන සේ පිළිතුරු සැපයීම කරන්න.

I කොටස

(1)
1. අපර විප්‍රවාසී යුගයේදී, එස්රා සැපයූ දායකත්වය ප්‍රධාන කරුණු සතරක් යටතේ ලියා දක්වන්න.
2. 'මෝසෙස්ගේ ජය ගීතය' තුළින් තහවුරු වන ප්‍රධාන කරුණු සතරක් නම් කරන්න (නික්මයාම 15/1-21).
3. දිවැසිවර ඉගැන්වීම් තුළ, යාවේ සමිඳුන්ගේ ස්වභාවය පැහැදිලි කිරීම සඳහා යොදා ඇති 'හෙසෙඩ්' යන්නෙහි අර්ථයන් සතරක් ලියා දක්වන්න.
4. නව ගිවිසුම තුළ, 'සුභාරංචිය' යන වචනයේ අරුත; කරුණු සතරක් ඇසුරින් පෙන්වා දෙන්න.
5. කුරුසගතව සිටි ජේසුස් වහන්සේට; අභියෝග හා අපහාස කළ පුද්ගල කණ්ඩායම් සතරක් නම් කරන්න.

(2)
1. ඊශ්‍රායෙලීය; ආදී මව්වරුන්ගේ සහ පියවරුන්ගේ, සොහොන් කොත් පිහිටා තිබූ ප්‍රධාන නගර සතරක් නම් කරන්න.
2. පුරාණ ගිවිසුම තුළ; පාස්කු ජනවන්දනාවේ දී සිදු කළ ප්‍රධාන අංගයන් සතරක් සහ එහි අර්ථයන් ද ලියා දක්වන්න.
3. දිවැසිවර ඉගැන්වීම් වලින් මතු කෙරෙන; සමාජය තුළ පවතින අසාධාරණත්වය සිදු කරන ක්ෂේත්‍ර සතරක් නම් කරන්න.
4. 'ප්‍රාතිහාර්යයක්' යනු කුමක්ද'යි ප්‍රධාන කරුණු සතරක් ඇසුරින් ලියා දක්වන්න.
5. මාක් කතුවරයාට අනුව; 'ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය' බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් සතර ලියා දක්වන්න.

(3)
1. සාමාරියාව ප්‍රදේශයට අයත් අනු නගර සතරක් ඉදිරිපත් කරන්න.
2. මෝසෙස් විසින්, දෙවියන් වහන්සේගේ ඉල්ලීම පිළිගැනීමක් සමඟම; දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාවට සමීපව කටයුතු කරන බැව් තහවුරු කරන නිදසුන් සතරක් ලියා දක්වන්න.
3. එසකියෙල් ගෙනහැර දක්වන පරිදි; විප්‍රවාසගතව විසූ ඊශ්‍රායෙල් ජනතාවගේ ප්‍රතිස්ථාපනය හේතු කොට ගෙන, 'නව ජීවනය' පැකිරෙන අංශයන් සතරක් ලියා දක්වන්න.
4. මතෙව් සුබාරංචිය; 'දේව රාජ්‍යයේ සුභාරංචිය' ලෙස හැඳින්වීමට හේතු වූ ප්‍රධාන දහම් පණිවිඩ සතරක් ලියා දක්වන්න.
5. මාක් 14/43-52 හි සඳහන්; 'ස්වාමීන් වහන්සේව අත්අඩංගුවට ගැනීමේ දී' ඇති වූ ප්‍රධාන සිදුවීම් සතරක් නම් කරන්න.

(ලකුණු 4 × 5 = 20 යි)

II කොටස

(4)
1. දස පණතේ ඇති ලක්ෂණයන් පහක් ලියා; ඒවා කෙටියෙන් විස්තර කොට දක්වන්න.
2. මිනිස් දුබලතා උපයෝගී කොට ගනිමින්; දෙවියන් වහන්සේ තම ස්වකීය දේව සැලැස්ම ඉදිරියට රැගෙන යන ආකාරය හුදෙක් 'ජාකොබ්ගේ චරිතය' ඇසුරින් පෙන්වා දෙන්න. ඔබගේ පිළිතුර වචන 200 කට පමණ සීමා කරන්න.

(5)
1. සමදර්ශක සුබපුවත්හි සඳහන් වන, 'අරිමතියයේ ජෝසප්' යනු කවරෙක්ද'යි කරුණු පහක් යටතේ පෙන්වා දෙන්න.
2. යෙසායා 7/10-17 මඟින් ඉදිරිපත් කරනු ලබන; 'එම්මානුවෙල් නාම ලකුණ' නැමැති විස්තරය හා සබැඳිව වචන 120 කින් පමණ, විස්තර කොට දක්වන්න.

(6)
1. දිවැසිවර කැඳවීමක පවතින මූලික ලක්ෂණ පහ වගු ගත කොට; එය දිවැසිවර යෙසායාගේ කැඳවීම හා සමඟ සසඳන්න.
2. ක්‍රිස්තුන් වහන්සේගේ සමයේ විසූ 'ආගමික කණ්ඩායම්' පහක් පිළිබඳව වෙන් වෙන් වශයෙන් විස්තර කොට දක්වන්න.

(7)
1. එදා; ඊශ්‍රායෙල් ජනතාවට දිවැසිවර සේවයක තිබූ අවැසිතාවය, මූලික කරුණු පහක් යටතේ පෙන්වා දෙන්න.
2. මතෙව් සහ ලූක් යන සුභාරංචි කතුවරුන් ගෙනහැර දක්වනු ලබන, 'කන්ද උඩ දේශනාව හුදෙක් නව ගිවිසුමේ ගිවිසුම් ව්‍යවස්ථාව යි.' වචන 200 ක් ආවරණය වන පරිදි, කිතුණු පුවත්පතක පළ කිරීමට සුදුසු ලිපියක් සකසන්න.

(8)
1. ඊශ්‍රායෙල් ජනතාව; පාස්කු භෝජන පිළිවෙත සිදුකළ ආකාරය, කරුණු දසයක් යටතේ පිළිවෙළින් පෙන්වා දෙන්න.
2. සමදර්ශක සුභාරංචි රචනය වීම හා සබැඳිව, වර්තමාන බයිබල් විශාරදයන් අතර පවතින නිගමනයන් පහක් ලියා, ඒවා විස්තර කොට දක්වන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

* * * * * * * * * * * * * * * * * * *

සියළුම හිමිකම් ඇවිරිණි.